මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.12.22

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. PED 03/2025

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා , ව්‍යවස්ථාපිත මණ්ඩල (විශ්ව විද්‍යාලද ඇතුළුව) සහ රජය සතු සමාගම්වල

සභාපතිවරුන් වෙත

**ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතුකොට ගෙන සේවයට නොපැමිණි රජය සතු ව්‍යවසායන්හි නිලධාරීන් සඳහා විශේෂ නිවාඩු ලබා දීම - 2025 නොවැම්බර්**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2025.12.15 දින නිකුත් කරන ලද ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතුකොට ගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධාරීන් සඳහා විශේෂ නිවාඩු ලබා දීමේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සමගාමීව සමගාමීව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. 2025 නොවැම්බර් මස දිවයිනේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක වෙත බලපෑ "දිට්වා"(Ditwah) සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ අධික සුළං තත්ත්වය සහ අධික වර්ෂාපතනය මත ඇති වූ ජල ගැලීම ගං වතුර හා නාය යෑම් යනාදියේ බලපෑම් මත සේවයට වාර්තා කිරීමට අපොහොසත් වූ පහත සඳහන් රජය සතු ව්‍යවසායන්හි නිලධරයන් සඳහා විශේෂ නිවාඩු ලබා දීමට තීරණය කර ඇත.

I. ඉහත කරුණු මත සිය පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පොදු ප්‍රවාහන සේවා ඇනහිටීම නිසා සේවයට වාර්තා කිරීමට නොහැකි වූ නිලධරයන්

II. මාර්ග අවහිර වීම හේතුවෙන් හෝ ඇති වූ ව්‍යසනයන්ගෙන් විපතට පත්වීම හේතුවෙන් හෝ අවතැන් වීම හේතුවෙන් හෝ සේවයට වාර්තා කිරීමට නොහැකි වූ නිලධරයන්

03. අදාළ නිලධරයා විසින් විශේෂ නිවාඩු ලබා ගැනීම සඳහා, තමාට රාජකාරියට වාර්තා කිරීමට නොහැකි වූ හේතුව ද සඳහන් කරමින්, ඇමුණුම 1 මඟින් ඉදිරිපත් කර ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව, ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ නිර්දේශය සහිත ඉල්ලීම අනුමැතිය සඳහා ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

04. මෙසේ ලබාදෙන විශේෂ නිවාඩු අදාළ ආයතනයේ පවත්වාගෙන යනු ලබන නිවාඩු ලේඛනයේ සුදුසු පරිදි ඇතුළත් කළ යුතු ය. මෙම අනුග්‍රහය 2025 වර්ෂයේ නොවැම්බර් මස ඇති වූ " දිට්වා "(Ditwah) සුළි කුණාටුව හේතුවෙන් දිවයිනේ විවිධ ප්‍රදේශවල ඇති වූ අධික වර්ෂාපතනය, ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා අධික සුළං තත්ත්වය නිසා සේවයට වාර්තා කිරීමට නොහැකි වූ නිලධරයන් සඳහා 2025 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලට අදාළව පමණක් ලබා දිය යුතුය.

ඒ.එන්. හපුගල
නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්

අත්/කළේ: ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති

ඇමුණුම I

**රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 03/2025 අනුව, ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතු කොට ගෙන සේවයට නොපැමිණි රජය සතු ව්‍යවසායන්හි නිලධාරීන් සඳහා විශේෂ නිවාඩු ඉල්ලුම් කිරීමේ ආකෘතිපත්‍රය - 2025 නොවැම්බර්**

01. නිලධරයාගේ සම්පූර්ණ නම : ..........................................................................................

02. තනතුර : ..................................................................................................................

03. රජය සතු ව්‍යවසායේ නම : ..........................................................................................

..............................................................................................................................

04. සේවා ස්ථානයේ ලිපිනය : ..........................................................................................

..............................................................................................................................

05. පදිංචි ලිපිනය :

ස්ථිර : ..............................................................................................................

..............................................................................................................

තාවකාලික : ......................................................................................................

..............................................................................................................

06. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..................................................................................

07. සේවයට වාර්තා කිරීමට නොහැකි වූ හේතුව :

| | | | |
|---|---|---|---|
| ජල ගැලීම් / ගංවතුර | ☐ | නායයෑම් | ☐ |
| මාර්ග අවහිරතා | ☐ | පදිංචි නිවසට හානි සිදු වීම | ☐ |

08. නිලධරයා සමඟ ආපදාවට ලක් වූ පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව : ......................................

09. ආපදාවට පෙර අවසන් වරට සේවයට වාර්තා කළ දිනය : ......................................

10. ආපදාවෙන් පසු සේවයට වාර්තා කළ දිනය : ......................................

11. නිවාඩු ඉල්ලුම් කරන දින ගණන : ......................................

12. දිනය : ......................... නිලධරයාගේ අත්සන : ......................................

ඇමුණුම II

13. ග්‍රාම නිලධාරිගේ නිර්දේශය :

ඉහත නම් සඳහන් ........................................................................................ මයා/මිය/මෙනවිය මාගේ ග්‍රාම සේවා වසමේ ස්ථිර පදිංචිකරුවෙකු වන අතර ඔහු විසින් ආපදා තත්ත්වයට අදාළව ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැවින් නිවාඩු ඉල්ලීම නිර්දේශ කරමි.

නම : ............................................................

දිනය : ...............................

අත්සන: ..............................
(නිල මුද්‍රාව තබන්න)

14. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය :

ඉහත නිර්දේශය හා එකඟ වෙමි./ එකඟ නොවෙමි. නිවාඩු ඉල්ලීම නිර්දේශය කරමි. / නිර්දේශය නොකරමි.

දිනය : ...............................

අත්සන: .............................
(නිල මුද්‍රාව තබන්න)

15. ආයතන ප්‍රධානියාගේ අනුමැතිය : නිවාඩු අනුමත කරමි./ නොකරමි.

නම : ...................................................................

තනතුර : ...................................................................

දිනය : ...............................

අත්සන: ...............................
(නිල මුද්‍රාව තබන්න)